# ජාතික රාජ්‍ය සභාවේ 1973 අංක 48 දරන ජාතික ලේඛනාරක්ෂක පනත

[සහතිකය සටහන් කළේ 1973 දෙසැම්බර් මස 11 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී

(1973 දෙසැම්බර් මස 21 වැනි දින ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රයේ II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී)

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී

කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළ දී ලබාගත හැකිය

# ජාතික රාජ්‍ය සභාවේ 1973 අංක 48 දරන ජාතික ලේඛනාරක්ෂක පනත

[සහතිකය සටහන් කළේ 1973 දෙසැම්බර් මස 11 වන දින]

එල්. ඩී.—ඕ. 3/70

ජාතික ලේඛනාරක්ෂක දෙපාර්තමේන්තුවක් පිහිටුවීම සඳහා විධිවිධාන සැලැස්වීම පිණිසත් පොදු ලේඛන ජාතික ලේඛනාගාරයට පැවරීම පිණිසත් රාජ්‍ය ලේඛනවල හා පොදු ලේඛනවල භාරය සහ ඒවා ආරක්ෂා කිරීම සඳහා හා මෙකී කරුණුවලට ආනුෂංගික හෝ සම්බන්ධ කරුණු සඳහා වඩාත් සුදුසු කාර්ය සංවිධාන ඇති කිරීම පිණිසත් වූ පනතකි.

ශ්‍රී ලංකා ජනරජයේ ජාතික රාජ්‍ය සභාව විසින් මෙසේ පනවනු ලැබේ :—

**1.** මේ පනත ජාතික රාජ්‍ය සභාවේ 1973 අංක 48 දරන ජාතික ලේඛනාරක්ෂක පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. **ලුහුඬු නාමය.**

**2.** මේ පනත ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයක් මගින් අමාත්‍යවරයා විසින් නියම කරනු ලබන දිනයක ක්‍රියාත්මක වේ. **ක්‍රියාත්මක වන දිනය.**

**3.** ජාතික ලේඛනාරක්ෂක දෙපාර්තමේන්තුව යනුවෙන් හඳුන්වනු ලබන දෙපාර්තමේන්තුවක් මෙයින් පිහිටුවනු ලැබේ. **ජාතික ලේඛනාරක්ෂක දෙපාර්තමේන්තුව.**

**4.** (1) (අ) ජාතික ලේඛනාරක්ෂක අධ්‍යක්ෂවරයා ලෙස හෝ එම අධ්‍යක්ෂවරයා වශයෙන් ක්‍රියා කිරීම සඳහා හෝ නමින් හෝ තිලයෙන් යම් තැනැත්තකු, සහ **නිලධරයන් පත් කිරීම.**

(ආ) මේ පනතේ කාර්යයන් සඳහා අවශ්‍ය විය හැකි වෙනත් නිලධරයන් හා සේවකයන් ද

පත් කරනු ලැබිය යුතු ය.

(2) මේ පනත ක්‍රියාත්මක වන දිනයට පෙරාතුවම වූ දිනයෙහිදී ජාතික ලේඛනාරක්ෂක දෙපාර්තමේන්තුවේ යම් තනතුරක් දරන සෑම තැනැත්තකුම, මේ පනත යටතේ පිහිටුවනු ලැබූ ජාතික ලේඛනාරක්ෂක දෙපාර්තමේන්තුවේ එම තනතුරම දරන ලෙස මේ පනත ක්‍රියාත්මක වන දිනයෙහි සිට සලකනු ලැබිය යුතු ය.

(3) මේ පනතේ කාර්යයන් සඳහා පත් කරනු ලබන සියලුම නිලධරයන් සහ සේවකයන් දණ්ඩ නීති සංග්‍රහයේ අර්ථානුකූලව සහ එහි කාර්යයන් සඳහා රාජ්‍ය නිලධරයන් ලෙස සලකනු ලැබිය යුතු ය. **19 අධි.**

**5.** (1) අමාත්‍යවරයා විසින් අනුමත කරන ලද සැලැස්මක් අනුව වූ ජාතික ලේඛනාගාර නිල මුද්‍රාවක් තිබිය යුතු අතර, ඒ මුද්‍රාව අධිකරණමය වශයෙන් පිළිගත යුතු ය. **නිල මුද්‍රාව.**

ඒ—01622—9,632 (73/10)

(2) ජාතික ලේඛනාගාර මුද්‍රාව අධ්‍යක්ෂවරයාගේ භාරයෙහි තිබිය යුතු අතර එය ඔහු විසින් හෝ ජාතික ලේඛනාගාර කාර්යයන් සඳහා එය පාවිච්චි කිරීමට ඔහු විසින් බලය පවරනු ලැබූ යම් නිලධරයකු විසින් හෝ පාවිච්චි කරනු ලැබිය හැකි ය.

ජාතික ලේඛනාරක්ෂක උපදේශක සභාව.

6. (1) ජාතික ලේඛනාරක්ෂක උපදේශක සභාව යනුවෙන් හඳුන්වනු ලබන (මෙහි මින් මතු "උපදේශක සභාව" යනුවෙන් සඳහන් කරනු ලබන්නා වූ) සභාවක් පිහිටුවිය යුතු අතර, එම සභාව නිල බලයෙන් පත්වන සාමාජිකයකු ලෙස අධ්‍යක්ෂවරයාගෙන් ද අමාත්‍යවරයා විසින් එහි සාමාජිකයින් ලෙස පත් කරනු ලබන පස් දෙනකුට නො අඩු සහ හත් දෙනකුට නො වැඩි වෙනත් තැනැත්තන් ගණනකින් ද සමන්විත විය යුතු ය.

(2) අධ්‍යක්ෂවරයා උපදේශක සභාවේ සභාපති විය යුතු අතර අමාත්‍යවරයා විසින් නම් කරනු ලබන වෙනත් නිලධරයකු එහි ලේකම් ලෙස කටයුතු කළ යුතු ය.

(3) අධ්‍යක්ෂවරයා හැර උපදේශක සභාවේ සෑම සාමාජිකයකුම කලින් ඔහු සිය ධූරය අත් හරිතහොත් හෝ අමාත්‍යවරයා විසින් ඔහු ධූරයෙන් ඉවත් කරනු ලැබුවහොත් හෝ මිස තමා පත් කරනු ලැබූ දින සිට අවුරුදු තුනක කාලයක් ධූරය දැරිය යුතු ය. කාලය ඉකුත් වීමෙන් ධූරය අත් හරින යම් සාමාජිකයකු නැවත පත් කරනු ලැබීමට සුදුසු විය යුතු ය.

(4) අමාත්‍යවරයා විසින් සභාපතිවරයා හැර ඕනෑම සාමාජිකයකු කිසිම හේතුවක් නොදක්වා ධූරයෙන් ඉවත් කරනු ලැබිය හැකි ය.

(5) අධ්‍යක්ෂවරයා විසින්, අවශ්‍ය යැයි ඔහු සලකන කවර විටක වුව ද උපදේශක සභාවේ රැස්වීම් කැඳවිය යුතු ය. එසේ වුවද, එක් එක් තුන් මස් කාල සීමාව තුළ යටත් පිරිසෙයින් එහි එක් රැස්වීමක් හෝ ඔහු විසින් කැඳවිය යුතු ය. තවද අමාත්‍යවරයා විසින් නියම කරනු ලබන කවර විටක වුවද ඔහු විසින් සභාවේ රැස්වීමක් කැඳවිය යුතු ය.

(6) සභාවේ අවසරය ප්‍රථමයෙන් නොලබා එහි අනුක්‍රමික රැස්වීම් තුනකට පැමිණීමට අපොහොසත් වන සභාවේ යම් සාමාජිකයකු ඔහුගේ සාමාජික ධූරය අත්හැරි ලෙස සලකනු ලැබිය යුතු ය.

උපදේශක සභාව සතු කටයුතු.

7. රාජ්‍ය ලේඛන තබන ස්ථාන නියම කිරීම හා එම ලේඛන ආරක්ෂා කිරීම සහ පාවිච්චි කිරීම, පොදු ලේඛනවල භාරය සහ පොදු ලේඛන පැවරීම, පෞද්ගලික සන්තකයෙහි තිබෙන ඓතිහාසික හෝ සංස්කෘතික හෝ සාහිත්‍යයික වටිනාකමක් ඇති ලේඛන හෝ අත් පිටපත් පරීක්ෂා කිරීම සහ ආරක්ෂා කිරීම, රාජ්‍ය ලේඛන මහජනයා විසින් පරීක්ෂා කිරීම සහ රාජ්‍ය ලේඛන සහ පෞද්ගලික අත් පිටපත් සංස්කරණය කොට පළ කිරීම පිළිබඳ සියලු කරුණු සම්බන්ධයෙන් අමාත්‍යවරයාට උපදෙස් දීම උපදේශක සභාවේ කටයුතු වන්නේ ය.

8. (1) අමාත්‍යවරයාගේ විධානයට සහ පාලනයට යටත්ව, ජාතික ලේඛනාගාරය සහ එහි තැන්පත් කර ඇති රාජ්‍ය ලේඛන පිළිබඳ භාරය අධ්‍යක්ෂවරයා විසින් දැරිය යුතු ය. තවද මේ පනත මගින් ඔහු වෙත පවරනු ලැබ ඇති හෝ ඔහුට නියම කරනු ලැබ ඇති නිශ්චිත කටයුතුවලට අතිරේකව, රාජ්‍ය ලේඛන සංරක්ෂණය සම්බන්ධයෙන් අවශ්‍ය වන සියලු පියවර ද ඔහු විසින් ගත යුතු ය.

අධ්‍යක්ෂවරයාගේ බලතල සහ කාර්ය.

(2) මේ පනතේ විධිවිධානවලට සහ මේ පනත යටතේ සාදන ලද නියෝගවලට යටත්ව, මේ පනත කාර්යක්ෂම ලෙස ක්‍රියාත්මක කිරීමේ කාර්යය සඳහා අවශ්‍ය යයි හෝ යෝග්‍ය යයි අධ්‍යක්ෂවරයාට පෙනී යන සියලු දේවල් කිරීමට ඔහුට හෝ ඔහු විසින් බලය පවරන ලද ජාතික ලේඛනාගාරයේ වෙන යම් නිලධරයකුට බලය තිබෙන අතර, විශේෂයෙන්—

(අ) නාමාවලී, සූචි පත්‍ර, උපදෙස් පොත්, ලේඛන ලැයිස්තු, දර්‍ශික, පෙළ පොත්, පරිවර්තන සහ තමාගේ භාරයේ ඇති රාජ්‍ය ලේඛන පරිශීලනයට සහාය වශයෙන් අවශ්‍ය විය හැකි වෙනත් දේ සැපයීම සහ ප්‍රසිද්ධ කිරීම ද,

(ආ) ලේඛන හෝ අත් පිටපත් කිසිවක් ජාතික ලේඛනාගාරයට පවරනු ලැබීම හෝ ජාතික ලේඛනාගාරය විසින් අත්කර ගනු ලැබීම පිළිබඳ නියම සහ කොන්දේසි කිසිවක් වේ නම් එම නියමයන්ට සහ කොන්දේසිවලට යටත්ව, තමාගේ භාරයේ පවතින රාජ්‍ය ලේඛන කිසිවක් වෙනත් ආකාරයකින් පිළියෙල කිරීම, සංස්කරණය කිරීම, මුද්‍රණය කිරීම හෝ වෙනත් යම් පොදු ප්‍රයෝජනයකට යෙදවීම ද,

(ඇ) රාජ්‍ය ලේඛන සුදුසු ආකාරයකින් ප්‍රතිසංස්කරණය කිරීමට හා සංරක්ෂණය කිරීමට කටයුතු පිළියෙල කිරීම සහ අවශ්‍ය විට යම් රාජ්‍ය ලේඛනයක ඡායාරූප පිටපත් හෝ අනු පිටපත් ගැනීම ද,

(ඈ) මහජන පරීක්ෂණයට ඇරී ඇති යම් රාජ්‍ය ලේඛනයක් කවර පුද්ගලයකු විසින් වුවද පරීක්ෂා කරනු ලැබීමට ඉදිරිපත් කිරීම හෝ ඉදිරිපත් කරවීම ද,

(ඉ) යම් ලේඛනයක්, අත් පිටපත් නැතහොත් ලියවිල්ලක් හෝ ස්ථිර ලෙස ආරක්ෂා කිරීම සඳහා ජාතික ලේඛනාගාරයේ තැන්පත් කර තැබිය යුතුයයි තමා අදහස් කරන වෙන යම් දෙයක් මිල දී ගැනීමෙන්, පරිත්‍යාග වශයෙන්, අන්තිම කැමැත්තෙන් ලැබීමෙන්, ගිවිසුමක් මගින් හෝ අන්‍යාකාරයකින් අත්කර ගැනීම හෝ තාවකාලික ව ඉල්ලා ගැනීම ද,

(ඊ) ශ්‍රී ලංකාව පිළිබඳ සඳහන් කිරීම් ඇතුළත් හෝ ශ්‍රී ලංකාව තුළ ප්‍රභවය ලැබූ නමුත්, ශ්‍රී ලංකාවෙන් පිටත තිබෙන යම් ලේඛනයක්, වෙන යම් අත් පිටපතක් නැතහොත් ලියවිල්ලක්, එහි මුල් පිටපත හෝ එහි යම් පිටපතක් තාවකාලිකව ඉල්ලා ගැනීමෙන් හෝ මිල දී ගැනීමෙන් හෝ ලබා ගැනීම සඳහා පරීක්ෂා කිරීම ද,

(උ) පෞද්ගලික සන්තකයෙහි තිබෙන යම් ලේඛන එකතුවක් හෝ මුද්‍රිත දේවල් එකතුවක් නාමාවලීගත කිරීමේ සහ සටහන් කර ගැනීමේ කාර්යයන් සඳහා පරීක්ෂා කිරීම සහ ඒ ලේඛන හෝ මුද්‍රිත දේවල් සංරක්ෂණය කිරීම සඳහා හෝ ආරක්ෂා කිරීම සඳහා අවශ්‍ය විය හැකි ශිල්පීය සහාය සහ උපකාර දීම, සහ

(ඌ) ජාතික ලේඛනාගාරයෙහි තැන්පත් කර ඇති ඕනෑම පංතියකට හෝ වර්ගයකට අයත් රාජ්‍ය ලේඛන්, පෞද්ගලික ලේඛන, අත් පිටපත් හෝ මුද්‍රිත දේ ජාතික ලේඛනාගාර ස්ථානයෙහි හෝ අන් ස්ථානයක මහජන ප්‍රදර්ශනයට හෝ සංදර්ශනයට තැබීම ද

ඔහු විසින් කළ හැකි ය.

(3) මේ පනත යටතේ අධ්‍යක්ෂවරයාගේ බලතල සහ කටයුතු අතුරින් කිසිවක් ඔහු විසින් ජාතික ලේඛනාගාරයේ යම් නිලධරයකු වෙත ලියවිල්ලකින් පවරනු ලැබිය හැකි ය.

පොදු ලේඛන තේරීම හා ජාතික ලේඛනාගාරයට පැවරීම.

9. (1) පොදු ලේඛන තැන්පත් කර ඇති කවර ස්ථානයකට වුවද ඇතුළුවීමේ බලය අධ්‍යක්ෂවරයාට තිබිය යුතු අතර ඒ ලේඛනවලින් තොරතුරු නාමාවලීගත කිරීම හෝ එකතු කිරීම පිණිස නැතහොත් එම ලේඛන ස්ථිර ලෙස ආරක්ෂා කිරීම සඳහා ඒවා ජාතික ලේඛනාගාරයට පැවරීම පිණිස අවශ්‍ය වන පියවර ගැනීමට ඒ ලේඛන පරීක්ෂා කිරීමේ බලය ද ඔහුට තිබිය යුතු ය.

(2) පහත සඳහන් පරිදි ක්‍රියා කිරීම, යම් රජයේ කාර්යාලයක වගකිවයුතු නිලධරයාගේ හෝ තත් කාලයෙහි පොදු ලේඛන කිසිවක භාරය දරන වෙන යම් තැනැත්තකුගේ කාර්යය විය යුතුය:—

(අ) ස්ථිර ලෙස ආරක්ෂා කිරීම සඳහා එවැනි පොදු ලේඛන පරීක්ෂාකර තෝරාගැනීම පිණිසත් ඒ පොදු ලේඛන ජාතික ලේඛනාගාරයට පැවරීම පිණිසත් අධ්‍යක්ෂවරයාට හෝ ඔහු විසින් ලියවිල්ලකින් බලය පවරන ලද වෙන යම් නිලධරයකුට සියලු පහසුකම් සැලසීම;

(ආ) අධ්‍යක්ෂවරයා හෝ එකී යම් තැනැත්තකු විසින් තෝරන ලද යම් පන්තියක හෝ වර්ගයක පොදු ලේඛන ජාතික ලේඛනාගාරය වෙත පවරනු ලබන තුරු එකී කාර්යාලයෙහි සුරකි රැකවරණයෙහි තබා ගැනීම;

(ඇ) තමාගේ භාරයෙහි තිබෙන එවැනි පොදු ලේඛන ජාතික ලේඛනාගාරයට පැවරීම සඳහා ඒවා තේරීම සහ නාමාවලීගත කිරීම සම්බන්ධයෙන් අධ්‍යක්ෂවරයා විසින් නියම කරනු ලැබිය හැකි කාර්ය ඉටු කිරීම;

(ඇ) ස්ථිර ලෙස ආරක්ෂා කිරීම සඳහා ජාතික ලේඛනාගාරය වෙත පැවරීමට අධ්‍යක්‍ෂවරයා නියම කරන්නා වූ, අවුරුදු විසිපහකට නොඅඩු කලක් පැරණි එවැනි ලේඛන ජාතික ලේඛනාගාරයට පැවරීම:

එසේ වුවද යම්කිසි පොදු ලේඛන ජාතික ලේඛනාගාරයට පැවරීම තාවකාලිකව කල් දමා, එකී රජයේ කාර්යාලයේ වගකිව යුතු නිලධරයා හා අධ්‍යක්ෂවරයා එකඟ වන කාලසීමාවකට, පරිපාලන කාර්ය යන් හෝ වෙනත් කාර්යයන් සඳහා, ඒ වාර්තා මුල් කාර්යාලයේ රඳවා තබා ගනු ලැබිය හැකි ය. එහෙත් එවැනි සෑම අවස්ථාවකදී ම රඳවා තබාගන්නා ලේඛනවල නාමාවලියක් වගකිව යුතු නිලධරයා විසින් අධ්‍යක්‍ෂවරයා වෙත යැවිය යුතු ය:

තවද, එසේම රහසිගත යයි හෝ රහස්‍ය ස්වභාවයෙන් යුක්ත යයි හෝ මහජනයාට එළිදරව් නොකළ යුතු වෙන යම් ප්‍රවෘත්තියක් අඩංගු යයි තමා විසින් සලකනු ලබන පොදු ලේඛන කිසිවක් වග කිව යුතු නිලධරයා විසින් ජාතික ලේඛනාගාරයට පවරන විට එම ලේඛන ජාතික ලේඛනාගාරයෙහි තැබීම හෝ මහජන පරීක්‍ෂණය සඳහා සැපයීම යම් කොන්දේසිවලට යටත්ව කළ යුතු ද ඒ කොන් දේසි ඔහු විසින් නිශ්චිතව දැක්විය හැකි අතර එම කොන්දේසි අනුව ක්‍රියා කිරීම අධ්‍යක්‍ෂවරයාගේ කාර්යය වන්නේ ය.

රජයේ කාර්යාලය වසා දැමීමට තිබෙන විට ලේඛන පිළිබඳ කාර්ය පටිපාටිය.

10. යම් රජයේ කාර්යාලයක් වසා දැමීමට හෝ අවසාන කිරීමට නියමිතව ඇති අවස්ථාවකදී එම රජයේ කාර්යාලයේ වගකිව යුතු නිලධරයා විසින් ඒ කාර්යාලයේ තිබෙන සියලුම පොදු ලේඛන පිළි බඳ සම්පූර්ණ නාමාවලියක් අධ්‍යක්ෂවරයා වෙත යැවිය යුතු අතර, ජාතික ලේඛනාගාරයෙහි ස්ථිරව ආරක්ෂාකර තැබීමට අධ්‍යක්‍ෂවරයා විසින් තෝරා ගනු ලබන හෝ නියම කරනු ලබන හෝ පොදු ලේඛන ජාතික ලේඛනාගාරයේ තැන්පත් කිරීමට එම වගකිව යුතු නිලධරයා විසින් කටයුතු පිළියෙල කළ යුතු ය.

කොමිසම් සභා පිළිබඳ ලේඛන අධ්‍යක්‍ෂවරයා වෙත යැවිය යුතු බව. 393 අධි.

11. පරීක්ෂණ කොමිසම් පනත යටතේ පත් කරන ලද යම් පරීක්ෂණ කොමිසම් සභාවකට හෝ අමාත්‍යවරයකු විසින් පත් කරනු ලබන යම් පරීක්ෂණ කමිටුවකට අදාළ සියලුම ලේඛන ඒ කොමිසම් සභාවේ හෝ ඒ කමිටුවේ අවසාන වාර්තාව ඉදිරිපත් කිරී මෙන් පසු තෙමසක් ඇතුළත ජාතික ලේඛනාගාරයෙහි තැන්පත් කිරීම අවස්ථාවෝචිත පරිදි එකී පරීක්ෂණ කොමිසම් සභාවේ නැතහොත් කමිටුවේ ලේකම්වරයාගේ කාර්යය විය යුතු ය.

පෞද්ගලික සන්තකයෙහි තිබෙන ලේඛන සහ අත් පිටපත්.

12. (1) ඓතිහාසික, සංස්කෘතික හෝ සාහිත්‍යයික වටිනා කමක් ඇති අත්පිටපතක් හෝ ලේඛනයක් වූ ද අවුරුදු පනහකට වඩා පැරණි වූද යම් අත්පිටපතක් හෝ ලේඛනයක් යම් පුද්ගල යකු සන්තකයෙහි තිබෙන විට ඒ පුද්ගලයා විසින් හෝ යම් ආයතනයක සන්තකයෙහි තිබෙන විට එහි ප්‍රධාන විධායක නිලධරයා විසින් එකී ලේඛනය හෝ අත්පිටපත පවතින බව අධ්‍යක්ෂවරයාට දැනුම් දෙනු ලැබිය හැකි ය.

(2) එම අත් පිටපත හෝ ලේඛනය පරීක්ෂා කිරීම සඳහා එකී පුද්ගලයා හෝ විධායක නිලධරයා විසින් අධ්‍යක්ෂවරයාට සියලු පහසුකම් සැලසිය යුතු ය.

(3) අධ්‍යක්ෂවරයා එකඟවුවහොත් එකී පුද්ගලයා හෝ විධායක නිලධරයා විසින් එම අත්පිටපත හෝ ලේඛනය ස්ථිර වශයෙන් හෝ තාවකාලික වශයෙන් ජාතික ලේඛනාගාරයේ තැන්පත් කළ යුතු අතර ඒ අත්පිටපත හෝ ලේඛනය මහජන පරීක්ෂණය සඳහා ඉදිරිපත් කළ යුත්තේ හෝ ප්‍රකාශනය සඳහා හෝ වෙන යම් කාර්ය යක් සඳහා ඉන් උද්ධෘත කොටස් හෝ පිටපත් ලබා ගත යුත්තේ යම් කොන්දේසිවලට යටත්ව ද ඒ කොන්දේසි ද එකී පුද්ගලයා හෝ නිලධරයා විසින් නිශ්චිත වශයෙන් සඳහන් කරනු ලැබිය හැකි ය.

ඇතැම් ප්‍රකාශනවල ඇතැම් පිටපත් හෝ ආදර්ශ පිටපත් අධ්‍යක්ෂවරයා වෙත යැවීම.

**13.** (1) (අ) යම් රජයේ කාර්යාලයකින් නිකුත් කරනු ලබන සෑම වාර්ෂික වාර්තාවකම, සෑම ගිණුම් ප්‍රකාශනයකම සහ අන් සෑම ප්‍රකාශනයකම පිටපතක්, එය නිකුත් කරන ලද දින සිට දින තිහක් ඇතුළත අධ්‍යක්ෂවරයා වෙත යැවීම ඒ කාර්යාලයේ වගකිව යුතු නිලධරයාගේ ද,

(ආ) තැපැල්පති විසින් නිකුත් කරනු ලබන එක් එක් අලුත් තැපැල් මුද්දරයක, ප්‍රථම දින ලියුම් කවරයක, තැපැල් ඇණවුම් ආකෘතියක, මුදල් ඇණවුම් ආකෘතියක, ගුවන් ලියුමක සහ තැපැල් පතක ආදර්ශයක්, එය නිකුත් කරන ලද දින සිට දින තිහක් ඇතුළත අධ්‍යක්ෂ වරයා වෙත යැවීම තැපැල්පතිගේ ද,

(ඇ) ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිකුත් කරනු ලබන සෑම අලුත් මුදල් නෝට්ටු වර්ගයකම අවලංගු කරන ලද ආදර්ශයක් සහ සෑම අලුත් කාසිය කම ආදර්ශයක්, එය නිකුත් කරන ලද දින සිට දින තිහක් ඇතුළත අධ්‍යක්ෂවරයා වෙත යැවීම මහා බැංකුවේ අධිපතිගේ ද,

(ඈ) මහජනයාට විකිණීම සඳහා මිණුම්පති විසින් නිකුත් කරනු ලබන සෑම සිතියමකම, පිඹුර කම සහ සෑම රේඛා සටහනකම හෝ අන් සෑම ප්‍රකාශනයකම පිටපතක් අධ්‍යක්ෂවරයා වෙත යැවීම මිණුම්පතිගේ ද,

(ඉ) ජාතික රාජ්‍ය සභාවේ මන්ත්‍රීවරයකු හෝ පළාත් පාලන ආයතනයක සභිකයකු තෝරා පත් කිරීම සඳහා පවත්වනු ලබන යම් මැතිවරණ යක හෝ අතුරු මැතිවරණයක අපේක්ෂකයකු විසින් හෝ වෙනුවෙන් මහජනයා අතර බෙදා හැරීම සඳහා නිකුත් කරනු ලබන යම් මැතිවරණ ප්‍රචාරක පතපොතක පිටපතක් එය

නිකුත් කරන ලද දින සිට දින තිහක් ඇතුළත, අධ්‍යක්ෂවරයා වෙත යැවීම එම අපේක්ෂකයා ගේ ද

කාර්යය වන්නේ ය.

(2) (1) වන උපවගන්තියේ කාර්යයන් සඳහා, "මැතිවරණ ප්‍රචාරක පතපොත" යන්නෙන් අපේක්ෂකයකු විසින් හෝ වෙනුවෙන් කඩදාසියෙහි හෝ වෙන යම් ද්‍රව්‍යයක අතින් ලියන ලද, මුද්‍රිත, රෝනියෝ කරන ලද හෝ වෙන යම් ආකාරයකින් පිළියෙල කරන ලද යම් ප්‍රතිපත්ති ප්‍රකාශනයක්, අත් පත්‍රිකාවක්, දැන්වීමක්, ලොකු දැන්වීම් පත්‍රයක්, ප්‍රදර්ශන පත්‍රයක්, පත්‍රිකාවක්, පොතක්, පින්තූරයක්, ඡායා රූපයක්, සිතියමක්, චිත්‍රයක් හෝ රේඛා සටහනක් අදහස් වේ.

ඇතැම් ලේඛන සහ අත් පිටපත් ශ්‍රී ලංකාවෙන් අපනයනය කිරීමේ තහනම.

14. (1) කිසිම තැනැත්තකු විසින්, තත් කාර්යය සඳහා අධ්‍යක්ෂවරයා විසින් නිකුත් කරන ලද බලපත්‍රයකින් ලත් අධිකාරය අනුව මිස, අවුරුදු පනහකට වඩා පැරණි පොදු ලේඛනයක්, ලේඛනයක්, අත් පිටපතක් හෝ මුද්‍රිත දෙයක් වූ ඓතිහාසික, සංස්කෘතික හෝ සාහිත්‍යයික වටිනාකමක් ඇති යම් පොදු ලේඛනයක්, ලේඛනයක් හෝ අත්පිටපතක් හෝ වෙන යම් මුද්‍රිත දෙයක් ශ්‍රී ලංකාවෙන් පිටතට අපනයනය නොකළ යුතු ය.

(2) එවැනි පොදු ලේඛනයක්, ලේඛනයක් හෝ අත්පිටපතක්, එය අපනයනය කිරීම ජාතික යහපතට හේතු නොවන තරමට ඓතිහාසික, සංස්කෘතික හෝ සාහිත්‍යයික වටිනාකමකින් යුක්ත බව අධ්‍යක්ෂවරයා සලකනහොත් එය අපනයනය කිරීමට බලපත්‍රයක් නිකුත් කිරීම සිය අභිමතය අනුව ඔහු විසින් ප්‍රතික්ෂේප කළ හැකි ය.

(3) මේ වගන්තිය යටතේ බලපත්‍රයක් නිකුත් කිරීම අධ්‍යක්ෂවරයා විසින් ප්‍රතික්ෂේප කරනු ලැබීමෙන් අතෘප්තියට පත් යම් තැනැත්තකු විසින් තමා වෙත ඒ ප්‍රතික්ෂේප කිරීම දැනුම්දුන් දින සිට දින දහහතරක් ඇතුළත ඒ ප්‍රතික්ෂේප කිරීමට විරුද්ධව අමාත්‍යවරයා වෙත අභියාචනා කළ හැකි අතර, අමාත්‍යවරයා ඒ සම්බන්ධයෙන් දෙන තීරණය අවසානාත්මක හා තිරණාත්මක විය යුතු ය.

පිටපත්වල සහ උද්ධෘතවල තථ්‍යභාවය සහතික කිරීම.

15. අධ්‍යක්ෂවරයා විසින් හෝ තත් කාර්යය සඳහා ඔහු විසින් බලය පවරන ලද වෙන යම් නිලධරයකු විසින් සත්‍යභාවය හා තථ්‍යභාවය යථා පරිදි සහතික කරනු ලැබ ඇතැයි සැලකෙන්නා වූ හා ජාතික ලේඛනාගාරයේ නිල මුද්‍රාව තබා ඇත්තාවූ, ජාතික ලේඛනාගාරයේ තැන්පත් කර ඇති යම් රාජ්‍ය ලේඛනයක හෝ පෞද්ගලික ලේඛනයක හෝ අත්පිටපතක පිටපතක් හෝ එහි උද්ධෘතයක් එහි මුල් ලේඛනය හෝ මුල් අත්පිටපත හෝ පිළිගත හැකි ආකාරයෙන්ම සහ ප්‍රමාණයටම යම් අධිකරණයක යම් නඩු කටයුත්තක දී සාක්ෂි වශයෙන් පිළිගත යුතු ය.

නියෝග.

**16.** (1) මෙහි මින් මතු නියම කරනු ලබන කාර්යයන් අතුරින් එකක් හෝ ඊට වැඩි ගණනක් සම්බන්ධයෙන් අමාත්‍යවරයා විසින් නියෝග සාදනු ලැබිය හැකි ය :—

(අ) ස්ථිර ලෙස ආරක්ෂා කිරීම සඳහා පොදු ලේඛන හා පෞද්ගලික ලේඛන සහ අත්පිටපත් තේරීම, ඒවා ජාතික ලේඛනාගාරයට පැවරීම හා එයි තැන්පත් කිරීම සහ ඒවා ජාතික ලේඛනාගාරයෙහි සාර්ථක ලෙස ආරක්ෂා කිරීම සඳහා ගතයුතු පියවර ;

(ආ) යම් නිශ්චිත පංතියක හෝ වර්ගයක පොදු ලේඛන ජාතික ලේඛනාගාරයට පවරනු ලබන තුරු, ජාතික ලේඛනාගාරය හැර වෙනත් ස්ථානවල තාවකාලිකව තැන්පත් කිරීම ;

(ඇ) ආණ්ඩුවේ දෙපාර්තමේන්තුවල සහ වෙනත් ආයතනවල තිබෙන පොදු ලේඛනවල භාරය සහ ඒවා රැකබලා ගැනීම;

(ඈ) මහජනයාට රාජ්‍ය ලේඛන බැලීමට ඉඩදීම සහ රාජ්‍ය ලේඛන හෝ යම් නිශ්චිත පංතියක හෝ වර්ගයක රාජ්‍ය ලේඛන මහජනයා විසින් පරීක්ෂා කරනු ලැබීමට ඉඩ දෙනු ලබන්නේ යම් නියමයන්ට සහ කොන්දේසිවලට යටත්ව ද ඒ නියමයන් සහ කොන්දේසි ;

(ඉ) මහජනයා විසින් රාජ්‍ය ලේඛනවලින් ලබාගන්නා තොරතුරු එළිදරව් කිරීම තහනම් කිරීම හෝ සීමා කිරීම ;

(ඊ) යම් පංතියක හෝ වර්ගයක රාජ්‍ය ලේඛන සම්බන්ධයෙන් රහස්‍යතාව රැකිය යුතු යයි යම් ලිඛිත නීතියක් මඟින් හෝ යටතේ නියමිතව ඇති විට ඒ රාජ්‍ය ලේඛන සම්බන්ධයෙන් ජාතික ලේඛනාගාරයේ නිලධරයන් විසින් රහස්‍යතාව රැකීම ;

(උ) ජාතික ලේඛනාගාරයෙහි ස්ථිර ලෙස ආරක්ෂා කිරීම සඳහා ඓතිහාසික, සංස්කෘතික හෝ සාහිත්‍යයික වටිනාකමක් ඇති අත්පිටපත් සහ ලේඛන සහ වෙනත් මුද්‍රිත දේවල් පුද්ගලයින්ගෙන් හෝ සංවිධානවලින් මිලට ගැනීම ;

(ඌ) රජයේ කාර්යාලවල තිබෙන වටිනාකමක් නැති පොදු ලේඛන හා වෙනත් ලේඛන විනාශ කිරීම සහ ඒ සඳහා උපලේඛන පිළියෙල කිරීම ;

(එ) රාජ්‍ය ලේඛන ප්‍රදර්ශන හෝ සංදර්ශන පැවැත්වීම.

(2) (1) වන උපවගන්තිය යටතේ අමාත්‍යවරයා විසින් සාදන ලද කිසිම නියෝගයක් එය ජාතික රාජ්‍ය සභාව විසින් අනුමත කරනු ලැබ ඒ අනුමතිය පිළිබඳ නිවේදනය ගැසට් පත්‍රයේ පළ කරනු ලබන තුරු බල නොපැවැත්විය යුතු ය.

**17.** (1) ජාතික ලේඛනාගාරයේ තැන්පත් කර ඇති යම් ලේඛනයක්, අත්පිටපතක් හෝ ලියවිල්ලක් දැන දැනම විරූපී කරන, ඒ මත යමක් ලකුණු කරන, එය විච්ඡේදනය කරන හෝ එයට අලාභහානි කරන හෝ මේ පනතේ හෝ මේ පනත යටතේ සාදන ලද යම් නියෝගයක විධිවිධාන අනුව නොවන වෙන යම් ආකාරයකින් යම් පොදු ලේඛනයක් විනාශ කරන හෝ මේ පනතේ හෝ මේ පනත යටතේ සාදන ලද යම් නියෝගයක විධිවිධාන කඩ කරන යම් තැනැත්තකු, වරදකරු කරනු ලැබූ විට, බරපතල වැඩ ඇතිව තෙමසකට නොවැඩි කාලයකට බන්ධනාගාරගත කරනු ලැබීමට හෝ රුපියල් එක් දාහකට නොවැඩි දඩයකට හෝ ඒ බන්ධනාගාරගත කරනු ලැබීම සහ දඩය යන දඬුවම් දෙකටම හෝ යටත් විය යුතු ය. දණ්ඩන.

(2) මහෙස්ත්‍රාත් අධිකරණයක සාමාන්‍ය අධිකරණ බල සීමා කෙසේ වුවද එය නොතකා මේ වගන්තිය යටතේ වූ යම් වරදක් පිළිබඳ නඩු විභාගය මහෙස්ත්‍රාත් අධිකරණයක් විසින් පැවැත්විය හැකි විය යුතු ය.

**18.** යම්කිසි ලිඛිත නීතියක් යටතේ පවත්වාගෙන යෑමට නියමිත පොදු ලේඛනයක් හෝ ලේඛනයක් මේ පනත යටතේ ස්ථිර ලෙස ආරක්ෂා කිරීම සඳහා ජාතික ලේඛනාගාරයට පවරන ලද හෝ එහි තැන්පත් කරන ලද විට, ඒ පොදු ලේඛනය හෝ ලේඛනය, මෙහි මුලින් සඳහන් කළ ලිඛිත නීතියේ විධිවිධාන යටතේ ජාතික ලේඛනාගාරයෙහි පවත්වාගෙන යනු ලබන ලෙස සලකනු ලැබිය යුතු අතර, ඒ අනුව, එම ලිඛිත නීතියේ විධිවිධාන ඒ පොදු ලේඛනයට හෝ ලේඛනයට සහ ඒ සම්බන්ධයෙන් අදාළ විය යුතු ය. යම්කිසි ලිඛිත නීති යටතේ පවත්වාගෙන යන ලදුව එම ලිඛිත නීතිම යටතේ පවත්වාගෙන යෑමට ජාතික ලේඛනාගාරයට පවරන පොදු ලේඛන ආදිය.

**19.** මේ පනතේ ඉහත දැක්වුනු විධිවිධානවල ඇතුළත් කිසිවකින් අවුරුදු එක් සියයකට අඩු කලක් පරණ වූද මෙහි ප්‍රථම උප ලේඛනයේ සඳහන් යම් ප්‍රඥප්තියක් යටතේ පවත්වාගෙන යනු ලබන්නා වූද යම් පොදු ලේඛනයක් කෙරෙහි බලපෑමක් ඇති වෙතියි නොසැලකිය යුතු ය. ඇතැම් පොදු ලේඛන අත්හැරීම.

**20.** මේ පනතෙහි ඇතුළත් කිසිවකින් ජාතික කෞතුකාගාර ආඥාපනතේ ක්‍රියාකාරිත්වය කෙරෙහි බලපෑමක් ඇති වෙතියි නොසැලකිය යුතු ය. ජාතික කෞතුකාගාර ආඥාපනතේ ක්‍රියාකාරිත්වය කෙරෙහි මේ පනත බලනොපාන බව. 187 අධි.

**21.** (1) මුද්‍රණාල ආඥාපනතෙහි 8 වන වගන්තියේ "රෙජිස්ට්‍රාර්" යන්නෙහි අර්ථ කථනය වෙනුවට පහත සඳහන් අලුත් අර්ථ කථනය ආදේශ කිරීමෙන් එම ආඥාපනත මෙයින් සංශෝධනය කරනු ලැබේ :— ඇතැම් ලිඛිත නීති සංශෝධනය කිරීම. 178 අධි.

'"රෙජිස්ට්‍රාර්" යන්නෙන් ජාතික ලේඛනාරක්ෂක දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂවරයා අදහස් වන අතර ජාතික ලේඛනාරක්ෂක දෙපාර්තමේන්තුවේ සහකාර අධ්‍යක්ෂවරයෙක්ද ඊට ඇතුළත් වේ.'.

179 අධි. (2) මුද්‍රණකරුවන් සහ ප්‍රකාශකයන් පිළිබඳ ආඥාපනතෙහි 13 වන වගන්තියේ "රෙජිස්ට්‍රාර්" යන්නෙහි අර්ථ කථනය වෙනුවට පහත සඳහන් අලුත් අර්ථ කථනය ආදේශ කිරීමෙන් එම ආඥා පනත මෙයින් සංශෝධනය කරනු ලැබේ:—

'"රෙජිස්ට්‍රාර්" යන්නෙන් ජාතික ලේඛනාරක්‍ෂක දෙපාර්තමේන්තුවේ අධ්‍යක්‍ෂවරයා අදහස් වන අතර ජාතික ලේඛනාරක්‍ෂක දෙපාර්තමේන්තුවේ සහකාර අධ්‍යක්‍ෂවරයෙක් ද ඊට ඇතුළත් වේ.'.

180 අධි. (3) ප්‍රවෘත්ති පත්‍ර ආඥාපනතෙහි 9 වන වගන්තියේ (2) වන උප වගන්තිය වෙනුවට පහත සඳහන් අලුත් උපවගන්තිය ආදේශ කිරීමෙන් එම ආඥාපනත මෙයින් සංශෝධනය කරනු ලැබේ:—

'(2) මේ ආඥාපනතෙහි, "පොත් සහ ප්‍රවෘත්ති පත්‍ර රෙජිස්ට්‍රාර්" යන්නෙන් ජාතික ලේඛනාරක්‍ෂක දෙපාර්තමේන්තුවේ අධ්‍යක්‍ෂවරයා අදහස් වන අතර, ජාතික ලේඛනාරක්‍ෂක දෙපාර්තමේන්තුවේ සහකාර අධ්‍යක්ෂවරයෙක්ද ඊට ඇතුළත් වේ.'.

179 අධි. (4) මේ පනත ක්‍රියාත්මක වන දිනයට පෙර යම් කාල සීමාවක් ඇතුළත මුද්‍රණකරුවන් සහ ප්‍රකාශකයන් පිළිබඳ ආඥාපනතේ 2 වන වගන්තිය යටතේ රෙජිස්ට්‍රාර් වෙත භාර දෙන ලද සෑම පොතකම එක් පිටපතක් සහ ප්‍රවෘත්ති පත්‍ර ආඥාපනතේ 7 වන වගන්තිය යටතේ රෙජිස්ට්‍රාර් වෙත භාර දෙන ලද සෑම ප්‍රවෘත්ති පත්‍රයක පිටපත ද ස්ථිර ලෙස ආරක්‍ෂා කිරීම සඳහා ජාතික ලේඛනාගාරයේ තැන්පත් කරන ලද පිටපතක් ලෙස සියලු කාර්යයන් සඳහා සලකනු ලැබිය යුතු ය. මේ පනත ක්‍රියාත්මක වන දිනයෙහි සහ ඉන් පසුව මුද්‍රණකරුවන් සහ ප්‍රකාශකයන් පිළිබඳ ආඥාපනතේ 2 වන වගන්තිය යටතේ යම් පොතක පිටපත් රෙජිස්ට්‍රාර් වෙත භාර දෙන ලද්ද වූ ද ප්‍රවෘත්ති පත්‍ර ආඥාපනතේ 7 වන වගන්තිය යටතේ ප්‍රවෘත්ති පත්‍රයක පිටපත රෙජිස්ට්‍රාර් වෙත භාර දෙන ලද්ද වූද අවස්ථාවකදී, එසේ භාර දෙන ලද ඒ පොතෙහි එක් පිටපතක් සහ ඒ ප්‍රවෘත්ති පත්‍ර පිටපත ස්ථිර ලෙස ආරක්‍ෂා කිරීම සඳහා රෙජිස්ට්‍රාර් විසින් නොපමාව ජාතික ලේඛනාගාරයේ තැන්පත් කළ යුතු ය.

ස්ථිරව ආරක්ෂා කිරීම සඳහා භාරගන්නා පොදු සහ පෞද්ගලික ලේඛන ජාතික ලේඛනාගාරයේ තැන්පත් කළයුතු බව.

22. ස්ථිරව ආරක්‍ෂා කිරීම සඳහා අධ්‍යක්‍ෂවරයා විසින් භාර ගනු ලබන සියලුම පොදු සහ පෞද්ගලික ලේඛන ජාතික ලේඛනාගාරයේ සුරක්ෂිතාගාරවල තැන්පත් කරනු ලැබිය යුතු ය.

ජාතික ලේඛනාගාරයෙන් වෙනත් තැනකට පොදු ලේඛන තාවකාලිකව යැවීම.

23. මෙහි මින්මතු විධිවිධාන සලස්වනු ලබන පරිදි හැර රාජ්‍ය ලේඛන කිසිම කාර්යයක් සඳහා ජාතික ලේඛනාගාරයෙන් වෙන යම්කිසි තැනකට ගෙන නොයා යුතු ය:

එසේ වුවද යම් රජයේ කාර්යාලයක් විසින් ජාතික ලේඛනාගාරය වෙත යවන ලද යම් ලේඛනයක්, ලියවිල්ලක්, අත්පිටපතක් හෝ වෙනත් දෙයක් ඒ කාර්යාලය විසින් පරීක්ෂා කිරීම සඳහා ඉල්ලනු

ඇබූ අවස්ථාවක, අධ්‍යක්ෂවරයා විසින් නිශ්චිතව සඳහන් කරනු ලබන කාල සීමාවක් ඇතුළත පරීක්ෂාකොට ආපසු එවීම සඳහා ඒ ලේඛනය, ලියවිල්ල, අත් පිටපත හෝ දෙය අධ්‍යක්ෂවරයා විසින් ඒ කාර්යාලය වෙත යවනු ලැබිය හැකි ය.

24. පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුව හොත් මිස, මේ පනතෙහි— අර්ථ නිරූපණය

"අධ්‍යක්ෂවරයා" යන්නෙන් ජාතික ලේඛනාගාරයේ අධ්‍යක්ෂවරයා අදහස් වන අතර ජාතික ලේඛනාගාරයේ සහකාර අධ්‍යක්ෂවරයෙක් ද ඊට ඇතුළත් වේ;

"අත් පිටපත" යන්නෙන් කඩදාසි, පුස්කොළ, තඹ, පිදී හෝ රත්රන් යන ද්‍රව්‍යයකින් හෝ කලුගල් නොවන වෙනත් ද්‍රව්‍යයකින් පිළියෙල කරන ලද අතින් ලියූ යම් ලේඛනයක් අදහස් වේ;

"ජාතික ලේඛනාගාරය" යන්නෙන් මේ පනත යටතේ පිහිටුවන ලද ජාතික ලේඛනාරක්ෂක දෙපාර්තමේන්තුව අදහස් වේ;

"පළාත් පාලන ආයතනය" යන්නෙන් යම් මහ නගර සභාවක්, නගර සභාවක්, සුළු නගර සභාවක් හෝ ගම් සභාවක් අදහස් වේ;

"පොදු ලේඛනය" හෝ "ලේඛනය" යන්නෙන් යම් රජයේ කාර්යාලයක නිල කාර්යයක් ඉටු කිරීමේ දී එම කාර්යාලයේ දී නිල වශයෙන් භාර ගන්නා ලද, ප්‍රකාශයට පත් කරන ලද හෝ පිළියෙල කරන ලද යම් අත්පිටපතක, ලියවිල්ලක, ලිපියක, රෙජිස්ටරයක, වාර්තාවක, පොතක, සඟරාවක, සිතියමක, රේඛා පත්‍රයක, පිඹුරක, චිත්‍රයක, පින්තූරයක, ඡායාරූපයක හෝ කලුගල් නොවන යම්කිසි ද්‍රව්‍යයක අතින් ලියන ලද, අඳින ලද, මුද්‍රණය කරන ලද හෝ වෙනත් යම් කිසි ආකාරයකින් ප්‍රකාශයට පත් කරන ලද වෙන යම් ලේඛනයක මුල් පිටපත හෝ පිටපතක් හෝ එහි යම් කොටසක් හෝ අදහස් වන අතර, යම් රජයේ කාර්යාලයක දී භාරගන්නා ලද යම් සිනමා ලේඛනයක්, සේයා පටියක්, තැටිගත කරන ලද්දක්, පටිගත කරන ලද්දක්, තැටියක් හෝ වෙන යම් මාධ්‍යයකින් ඉදිරිපත් කරන ලද්දක් ඊට ඇතුළත් වේ;

"මුද්‍රිත දෙය" යන්නෙන් යම් යාන්ත්‍රික ක්‍රමයකින් හෝ වෙනත් ක්‍රමයකින් මුද්‍රණය කරන ලද යම් පොතක්, සඟරාවක්, පත්‍රිකාවක්, ප්‍රවෘත්ති පත්‍රයක් හෝ තොරතුරු අඩංගු වෙන යම් කඩදාසියක් අදහස් වේ;

"රජයේ කාර්යාලය" යන්නෙන් මෙහි දෙවන උපලේඛනයෙහි සඳහන් යම් කාර්යාලයක් අදහස් වේ;

" රාජ්‍ය ලේඛන " යන්නෙන් ස්ථිර ලෙස ආරක්ෂා කිරීම සඳහා ජාතික ලේඛනාගාරයේ තබනු ලැබූ හෝ තැන්පත් කරනු ලැබූ සියලු පොදු ලේඛන සහ වෙන යම් අත් පිටපතක්, ලේඛනයක් හෝ මුද්‍රිත දෙයක් අදහස් වේ ;

" වගකිවයුතු නිලධරයා " යන්නෙන්, යම් රජයේ කාර්යාලයක් සම්බන්ධයෙන් වූ විට, එම රජයේ කාර්යාලයේ ප්‍රධානියා හෝ එම කාර්යාලයේ ප්‍රධානියාගේ කාර්ය සහ කටයුතු තත් කාලයේ ඉටු කරන නිලධරයා අදහස් වේ.

## පළමුවන උපලේඛනය (19 වන වගන්තිය)

දරුකමට හදා ගැනීමේ ආඥාපනත (61 වන අධිකාරය)

උපත් හා මරණ ලියාපදිංචි කිරීමේ පනත (110 වන අධිකාරය)

මරණ ලියාපදිංචි කිරීමේ (හදිසි අවස්ථා විධිවිධාන) ආඥාපනත (111 වන අධිකාරය)

විවාහ ලියාපදිංචි කිරීමේ ආඥාපනත (112 වන අධිකාරය)

උඩරට විවාහ සහ දික්කසාද පනත (113 වන අධිකාරය)

උඩරට පාරම්පරික හිමිකම් ආඥාපනත (114 වන අධිකාරය)

මුස්ලිම් කසාද හා දික්කසාද පනත (115 වන අධිකාරය)

විදේශ විවාහ ආඥාපනත (116 වන අධිකාරය)

ලේඛන ලියාපදිංචි කිරීමේ ආඥාපනත (117 වන අධිකාරය)

සන්නස් හා පැරණි ඔප්පු ආඥාපනත (118 වන අධිකාරය)

පැරණි ඔප්පු හා සාධනපත්‍ර ලියාපදිංචි කිරීමේ ආඥාපනත (119 වන අධිකාරය)

ඉඩම් ලේඛන (ප්‍රතිසංස්කෘත පත් ඉරු) ආඥාපනත (120 වන අධිකාරය)

රෙජිස්ට්‍රාර් කටයුතු වලංගු කිරීමේ ආඥාපනත (121 වන අධිකාරය)

ඇටෝර්නි බල ආඥාපනත (122 වන අධිකාරය)

## දෙවන උපලේඛනය (24 වන වගන්තිය)

### රජයේ කාර්යාලය

ශ්‍රී ලංකා ජනරජයේ ජනාධිපතිවරයාගේ කාර්යාලය.

අමාත්‍ය මණ්ඩලයේ කාර්යාලය.

ජාතික රාජ්‍ය සභාවේ කාර්යාලය.

අමාත්‍ය මණ්ඩලයේ යම් අමාත්‍යවරයකුගේ කාර්යාලය.

ආණ්ඩුවේ දෙපාර්තමේන්තුවක කාර්යාලය.

අධිකරණයක කාර්යාලය.

යුද්ධ හමුදාවේ, නාවික හමුදාවේ හෝ ගුවන් හමුදාවේ කාර්යාලය.

ශ්‍රී ලංකාවේ යම් තානාපතිවරයකුගේ, මහා කොමසාරිස්වරයකුගේ හෝ වෙනයම් රාජ්‍ය දූත නියෝජිතයකුගේ ශ්‍රී ලංකාවෙන් පිටත පිහිටා ඇත්තා වූ කාර්යාලය.

පළාත් පාලන ආයතනයක කාර්යාලය.

ශ්‍රී ලංකා විශ්ව විද්‍යාලයේ කාර්යාලය.

යම් ප්‍රඥප්තියක් යටතේ පිහිටුවනු ලැබ ඇත්තා වූද, ප්‍රාග්ධනයෙන් කොටසක් හෝ ප්‍රාග්ධනය සම්පූර්ණයෙන්ම හෝ ආණ්ඩුවෙන් සපයනු ලැබ ඇත්තාවූද යම් රාජ්‍ය සංස්ථාවක කාර්යාලය.